// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1857/34 - 2014 අප්‍රේල් මස 11 වැනි සිකුරාදා - 2014.04.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත

2 වැනි වගන්තිය යටතේ නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වන ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වැනි තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි. මෙම නියමය 2014 අප්‍රේල් මස 11 වැනි දින සිට ආරම්භ වන මාස 02ක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතු ය.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2014 අප්‍රේල් මස 11 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| *I වැනි තීරය* | | | | *II වැනි තීරය* |
|---|---|---|---|---|
| *වෙළඳ භාණ්ඩය* | | | | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| | *සං. ව. ශීර්ෂය* | *සං. ව. සංකේතය* | *විස්තරය* | |
| 1. | 10.05 | 1005.90 | බඩ ඉරිඟු - අනෙකුත් | කි. ග්‍රෑමයට 10% |
| 2. | 10.07 | 1007.10 | ඉදල් ඉරිඟු ඇට (සෝගම්) - බීජ | කි. ග්‍රෑමයට 10% |
| | | 1007.90 | ඉදල් ඉරිඟු ඇට (සෝගම්) - අනෙකුත් | කි. ග්‍රෑමයට 10% |

04 - 91

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
1A - PG 2036 — 650 (2014/04)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.